# ඔන්ලයින් හානි: සමාගම් විසින් අන්තර්ගතයන් සමාලෝචනය කිරීම සහ නියාමන ආකෘති

"ඩිජිටල් ආර්ථිකයේ පෙරමුණු" සංවාද මාලාවේ තුන්වන සාකච්ඡාව

"අන්තර්ගතයන් සමාලෝචනය කිරීම සහ නියාමන ආකෘති" පිළිබඳ විශේෂඥ වට මේස සාකච්ඡාවේ වාර්තාව

2022 ඔක්තෝබර් 27 දින, 0830 – 1030 UTC කාලය තුළ Zoom ඔස්සේ


LIRNEasia Solutions යනු LIRNEasia හි අනුබද්ධිත ආයතනයකි. දිළින්දන් සහ වෙළඳපොළ කෙරෙහි හිතවාදී බුද්ධිමය සංවිධානයක් වන LIRNEasiaහි මෙහෙවර වන්නේ දැනුම, තොරතුරු සහ තාක්‍ෂණය භාවිතා කරමින් ආසියා සහ පැසිෆික් කලාපයේ මිනිසුන්ගේ ජීවිත වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ හරහා ප්‍රතිපත්ති වෙනස් කිරීම දිරිගැන්වීමයි.

සම්බන්ධ කරගත හැකි ආකාරය: අංක 15 1/2, බැල්කොම්බ් පෙදෙස, කොළඹ 8 (Balcombe Place, Colombo 00800, Sri Lanka). දුරකථනය +94 11 267 1160. ඊමේල්: info@lirneasia.net. වෙබ්: www.lirneasia.net



" ඩිජිටල් ආර්ථිකයේ පෙරමුණු" සංවාද මාලාවට සහාය සහ අනුග්‍රහය දක්වන්නේ මෙටා සමාගම විසිනි.

## මූලික සාරාංශය

සමාජ මාධ්‍ය හෙවත් පරිශීලකයන් විසින් ජනනය කරන ලද අන්තර්ගතයන් ප්‍රකාශනය සහ බෙදාහැරීම කළ හැකි වේදිකාවන් වර්තමාන ජීවිතයේ සෑම තැනකම විහිදී පවතින අංගයකි. මෙම නව මාධ්‍ය සතුව තිබෙන ප්‍රවේගය සහ තොරතුරු බෙදාහැරීමේදී සිදුකළ හැකි ප්‍රකාශන ශක්තිය හේතුවෙන් නව අභියෝග මාලාවක් මතුවී තිබේ. එම වේදිකාවන් හානි අවම කිරීමේ අභියෝගය සමඟ ගැටෙමින් සිටින අතර, අන්තර්ගතයන් සමාලෝචනය කිරීම වඩ වඩාත් වැදගත් වී මතභේදයට ද තුඩු දී ඇත. වේදිකාවන් විසින් ඒවායේ අදාළ අවකාශයන් නියාමනය කරන බැවින්, අන්තර්ගතයන් සමාලෝචනය කිරීම සම්බන්ධ තීරණ හේතුවෙන් ගැටලු මතුවී තිබේ. සමහර අවස්ථාවලදී, වේදිකාවල අන්තර්ගතයන් සමාලෝචනය කිරීමට මැදිහත් වීමට සහ එම කාර්යය සම-නියාමනය කිරීමට රජයන් ද උත්සාහ දරා ඇත.

ලිහිල් අන්දමින් සම-නියාමනය කිරීම යනු මෑත කාලයේදී ඉදිරිපත් කරන ලද විකල්පයකි. ඔන්ලයින් ආරක්ෂාව සහ හානි පිළිබඳ නවසීලන්ත භාවිතා සංග්‍රහය මෙම ප්‍රවේශයට උදාහරණයකි. එහි පද්ධති මත පදනම් වූ සහ සමස්ත සමාජය ආවරණය කරන ප්‍රවේශය මගින් හානි කල්තබා දැක ඒවා අවම කිරීමට උත්සාහ කරනු ලැබේ. එවැනි රීති සංග්‍රහයක් "සැමට සරිලන" විසඳුමක් නොවේ. කෙසේ වෙතත්, එවැනි රීති සංග්‍රහවල නම්‍යශීලීභාවය විවිධ සන්දර්භයන්ට සහ වෙනස් වන තාක්ෂණයන්ට සහ කථන භාවිතයන්ට අනුවර්තනය වීමට අවස්ථාව ලබාදෙයි. කර්මාන්ත රීති සංග්‍රහ "නියාමන පරීක්ෂා පසුබිමක්" ලෙස සැලකිය හැකිය. එය වෙනත් විසඳුම් සලකා බැලීම සඳහා අවශ්‍ය අධ්‍යයනයන්ට ඉඩ සලසයි. ඔන්ලයින් හානිවලට දායක වන, නිරන්තරයෙන් පරිණාමය වන සහ සංකීර්ණ සාධක අවබෝධ කර ගැනීම සඳහා සාමූහිකව උත්සාහ කරන පුරවැසියන්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ වේදිකා අතර සියුම් සංවාදයක් සක්‍රීය කිරීමේ හැකියාව මෙම රීති සංග්‍රහයන්ට තිබේ. ඔවුන්ට වටිනා ඉගෙනුම් අවස්ථා ලබා දිය හැකි අතර සමබර හා ස්ථිර විසඳුම් සංවර්ධනය කිරීමට සහාය විය හැකිය.

දැනට පවතින අන්තර්ගත සමාලෝචනය කිරීමේ ව්‍යූහයන්, මෙවලම් සහ නියාමන විකල්පයන් පිළිබඳ පොදුභාවයන් සහිත රටවල රජය, සිවිල් සමාජය, පෞද්ගලික අංශය සහ ශාස්ත්‍රාලික ක්‍රියාකාරීන් අතර අතථ්‍ය සංවාදයක හරය මෙම වාර්තාව මගින් ඉදිරිපත් කරනු ලැබේ. එහි නිර්දේශ වන්නේ:

- කර්මාන්ත රීති සංග්‍රහ සකස් කරන විට පමණක් නොව, ඒවා වෙනස් වූ තාක්‍ෂණයට සහ වෙනත් කොන්දේසිවලට ප්‍රතිචාරාත්මක ලෙස වරින් වර සංශෝධනය කරන විට ද ඇතුළත් කිරීම් සඳහා ඇති අවස්ථා පුළුල් කිරීම පිළිබඳ පාර්ශ්වකරුවන් විසින් සලකා බලන්න.
- "නියාමන පරීක්ෂා පසුබිම්" ලෙස භාවිතා කළ හැකි, කර්මාන්තයේ ලිහිල් නියාමන රීති සංග්‍රහ පිළිබඳ සලකා බලන්න. හානිකර අන්තර්ගතයන් බෙදා හැරීමට සහ ප්‍රකාශනයේ නිදහසට නියාමනය මගින් ඇති කරන බලපෑම් පිළිබඳව ඉගෙන ගැනීමට රාජ්‍යයට සහ පාර්ශවකරුවන්ට එවැනි ප්‍රවේශයක් මඟින් ඉඩ සැලසේ. අවශ්‍ය යැයි සැලකේ නම්, දැනුම මත පදනම්ව නීති සම්පාදනය සඳහා මෙමගින් අවස්ථාව සැලසේ. උදාහරණයක් ලෙස, එවැනි රීති සංග්‍රහයක් මගින් වේදිකා සමාගම්වල කර්මාන්ත රීති සංග්‍රහ ඔස්සේ අන්තර්ගතයන් සමාලෝචනය කරන ආකාරය පිළිබඳ සෑහීමකට පත් නොවන අන්තර්ගත නිර්මාණය කරන්නන්/ බෙදාහරින්නන් සඳහා විසඳුම් ලබාදීමට සලකා බලන්න.
- එයට සමාන්තරව, නීති විරෝධී අන්තර්ගතයන් සහ නීති විරෝධී නොවනමුත් අයෝග්‍ය අන්තර්ගතයන් අතර වෙනස හඳුනා ගැනීම සඳහා අදාළ රටවල නීති විරෝධී අන්තර්ගතයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතු අංශවල ධාරිතාව වර්ධනය කරන්න.
- ආණ්ඩු සහ අන්තර්ගත වේදිකාවන් අතර සංවාදශීලී සම්බන්ධතාවක් පවත්වා ගන්න: නිශ්චිත අධිකරණ බල ප්‍රදේශවල අන්තර්ගතයන් අනුමැතියට ප්‍රවේශ වන විට ප්‍රතිපෝෂණයට විවෘත වීම සහ පාර්ශවයන් අතර සහයෝගී ප්‍රවේශයක් අනුගමනය කිරීම දෙපාර්ශ්වය අතර විශ්වාසය තහවුරු කිරීමට උපකාරී වේ. දේශීය අවශ්‍යතා, සිරිත් විරිත් සහ සම්ප්‍රදායන් සැලකිල්ලට ගත යුතු විට මෙය විශේෂයෙන් ප්‍රයෝජනවත් විය හැකිය.

## ගැටලුව

විවිධ ආකාරවල ඔන්ලයින් හානි විවිධ අය සංජානනය කරති. එම හානි අන්තර්ජාලයේ විනෝද හිංසනය සහ බුද්ධිමය දේපල උල්ලංඝනය කිරීම්වල සිට ප්‍රචණ්ඩත්වය උසිගැන්වීම හෝ ඒ සඳහා පහසුකම් සැලසීම දක්වා වන පරාසයක පවතී. තමන්ට හානියක් වුනැයි සිතන අය ඒවාට පිළියම් වේදිකා සපයන සමාගම් සහ රජයන්ගෙන් ඉල්ලා සිටිති.

පරිශීලකයන් විසින් ජනනය කරන ලද අන්තර්ගතයන් (UGC) අතිශය වේගවත් හා ප්‍රකාශනශීලී ලෙස බෙදා හැරීමට සමාජ මාධ්‍ය වේදිකා මගින් සිදු කල හැකි බැවින්, උසාවි නියෝග හෝ පරිපාලන ක්‍රියාමාර්ග හරහා ලබා ගන්නා ප්‍රතිකර්ම, අගතියට පත් පාර්ශ්වයන් සහ රාජ්‍ය බලධාරීන් අපේක්ෂා කරන තරම් පූර්ණ විසඳුම් නොවේ. එබැවින්, UGC මගින් සිදු වන හානිවලට ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීම, එම අන්තර්ගතයන් ඉවත් කිරීම හෝ ඒවා පාඨකයන් වෙත ළඟාවීම අඩු කිරීම සම්බන්ධ වගකීම බොහෝ විට වේදිකා සපයන්නන් මත පැටවේ.

එබැවින් බොහෝ සමාජ මාධ්‍ය වේදිකා සපයන්නන් විසින් අන්තර්ගතයන් සමාලෝචනය කිරීමේ විවිධ ක්‍රම ක්‍රියාත්මක කර තිබේ. ඒවා නම්, ඇල්ගොරිතම මගින් ඉවත්කිරීම්, මානව නියෝජිතයන් විසින් සමාලෝචනය කිරීම, ප්‍රමුඛතා ලබා නොදීම, නැවත නැවත වැරදි කරන්නන් ලෙස සැලකෙන අයගේ ගිනුම් තහනම් කිරීම් සහ අත්හිටුවීම් ආදියයි. මෙය "පෞද්ගලික නියාමනය" (මෙතැන් සිට ස්වයං නියාමනය) ලෙස සඳහන් කෙරේ. එය ලිහිල් හෝ දැඩි සම-නියාමන ස්වරූපයක් විය හැකි අතර එමඟින් වේදිකා සපයන්නන් සම්බන්ධයෙන් නිශ්චිත ආකාරයකින් ක්‍රියා කිරීමට රජයට සිදු වේ.

UGC ඍජුවම පාලනය කිරීමේ ප්‍රයත්නවල ද රජය නිරත වේ. එය සාමාන්‍යයෙන් සිදුකරන්නේ නීතියකින් දක්වා ඇති වරදක් කර ඇතැයි සැලකෙන අන්තර්ගතයන් නිර්මාපකයන්ට සහ බෙදාහරින්නන්ට එරෙහිව පශ්චාත් සිද්ධි නඩු පැවරීමේ ස්වරූපයෙන්ය. අන්තර්ගතයන් සමාලෝචනය කිරීම සහ නියාමනය කෙරෙහි අවධානය යොමු කිරීමට අතථ්‍ය සංවාදය විසින් උත්සාහ කරන ලදි. එහෙත්, සංවාදය අතරතුර හෙළිදරව් වූ කරුණක් වන්නේ, ඍජුව UGC පාලනය කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය බලධාරීන්ගේ ක්‍රියා හෝ සැලසුම් මගින් අන්තර්ගතයන් සමාලෝචනය කිරීමේ භාවිතාවන් නියාමනය කිරීම පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ ස්ථාවරවලට බලපෑම් ඇති වන බවයි. එබැවින් එය වාර්තාවේ අදාළ ආකාරයෙන් සඳහන් කරනු ඇත.

## අතථ්‍ය සංවාදය

අතථ්‍ය සංවාදය සැලසුම් කරනු ලැබුවේ වේදිකා සපයන්නන් විසින් අන්තර්ගතයන් සමාලෝචනය කිරීම සහ රාජ්‍යය විසින් නියාමනය කිරීම (සම-නියාමනය) කෙරෙහි අවධානය යොමු කිරීම සඳහාය. වේදිකා සපයන්නන් විසින් අන්තර්ගතයන් සමාලෝචනය කිරීම "දුෂ්ට ගැටලුවක්" [1] වන අතර එහිදී විවිධ පාර්ශ්වයන්ට ගැටලුවේ ස්වභාවය පිළිබඳව හෝ එක් අදහසකට පැමිණිය නොහැකි විය. කිසිදු ආකාරයක විසඳුමක් මගින් සෑම කෙනෙකුම සතුටු කළ නොහැක. ක්‍රියාත්මක නොවීම ද දෝෂාරෝපණයට හේතු වේ. ගනු ලබන ක්‍රියා පක්ෂග්‍රාහී බවට අභියෝග එල්ල වනු ඇත. තමන් මුහුණදෙන තත්වයන්ට වඩාත් උචිත විසඳුම් පිළිබඳ තීරණ ගැනීමට සහභාගිවන්නන්ට සහාය වීම මෙහි අරමුණ විය. එහිදී වෙනත් රටවල අත්දැකීම් සහ අදාළ අධ්‍යයනයන් පදනම් කරගන්නා ලදි.

බංග්ලාදේශය, භූතානය, නේපාලය, මාලදිවයින, ඇෆ්ගනිස්ථානය, පකිස්ථානය, ශ්‍රී ලංකාව (BBNMAP) යන රටවල් අනුව සහ ඔවුන්ගේ අනුබද්ධතාව අනුව වටමේස සාකච්ඡාවට සහභාගී වූවන්ගේ සංයුතිය පළමු ඇමුණුමෙහි දක්වා ඇත. සහභාගී වූවන්ගේ ලැයිස්තුව දෙවන ඇමුණුමෙහි දක්වා තිබේ. චැතම් හවුස් නීති යටතේ වටමේස සාකච්ඡාව පැවැත්විණි (චැතම් හවුස් නීති අනුව රැස්වීමකදී හෙළිදරව් කරන ලද තොරතුරු පැමිණ සිටින අය විසින් වාර්තා කළ හැකි මුත් එම තොරතුරුවල මූලාශ්‍රය පැහැදිලිව හෝ ව්‍යංගයෙන් හඳුනාගත නොහැකි පරිදි ඉදිරිපත් කළ යුතුය).

[1] Head, B.W. (2022). Wicked Problems in Public Policy. Palgrave Macmillan, Cham. https://doi.org/10.1007/978-3-030-94580-0_2

LIRNEasia හි රොහාන් සමරජීව විසින් වටමේස සාකච්ඡාව මෙහෙයවීම සිදුකරන ලදි. අතථ්‍ය සංවාදය සඳහා සහභාගී  වූ සභාවේ සාමාජිකයින් වූයේ:

- නවසීලන්තයේ Netsafe හි ප්‍රධාන විධායක නිලධාරී බ්‍රෙන්ට් කේරී (Brent Carey) - ඔන්ලයින් ආරක්ෂාව සහ හානි පිළිබඳ Aotearoa නවසීලන්ත පුහුණු සංග්‍රහය අනුගමනය කර ඇති ආකාරය, එයට සම්බන්ධ වීමට එකඟ වූ වේදිකාවන් සහ එය පසුගිය මාස කිහිපය තුළ ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳව කතා කළේය.
- මෙග් චැං (Meg Chang), අන්තර්ගත නියාමන ප්‍රතිපත්ති නායක හා Meta හි APAC ප්‍රධානියා - Meta විසින් අන්තර්ගත නියාමනය වෙත ප්‍රවේශ වන ලද ආකාරය සහ තාක්ෂණය සහ ප්‍රකාශන භාවිතයන් යන දෙකම ගතික වන අවකාශයක අන්තර්ගතයන් සමාලෝචනය කිරීමේ හොඳම භාවිතාවන් ලෙස සැලකෙන දේ පැහැදිලි කළේය.
- මැලේසියාවේ (සහ බංග්ලාදේශයේ) මලයා විශ්ව විද්‍යාලයේ මහාචාර්ය එර්ෂාදුල් කරීම් (Ershadul Karim) - සමාජ මාධ්‍ය වේදිකාවල පරිශීලකයන් විසින් ජනනය කරන ලද අන්තර්ගතයන් සඳහා නියාමන විකල්ප ගැන කතා කළේය.
- පකිස්ථානයේ Soch Fact Check හි සොෆියන් සුල්තාන් (Sofyan Sultan) - සමාජ මාධ්‍ය වේදිකාවල අන්තර්ගතයන් නියාමනය පිළිබඳ කරුණු පරීක්ෂක ඉදිරිදර්ශනය ඉදිරිපත් කළේය.
- ශ්‍රී ලංකාවේ LexAG හි ආරම්භක හවුල්කරු සහ ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ පර්යේෂණ සහකාර ආචාර්ය ගෙහාන් ගුණතිලක, රාජ්‍ය සන්දර්භය අතික්‍රමණය වන පසුබිමක් තුළ අන්තර්ගතයන් නියාමනය කරන ආකාරය සාකච්ඡා කළේය.

## විසඳුම් වට්ටෝරුව

සියල්ලන්ටම ගැලපෙන එක් විසඳුමක් නොමැති බවට සියලුදෙනා එකඟ වූහ. සන්දර්භයෙහි වෙනස්කම් පැවතියද, ලෝකයේ අනෙකුත් කලාපවලින් උගත් පාඩම් භාවිතා කළ හැකි බව ද පිළිගන්නා ලදි. එක් එක් රටවල විශේෂිත තත්වයන් සම්බන්ධයෙන් ඒවා විවේචනාත්මකව ඇගයීමට ලක් කළ හැකිය. විශේෂයෙන් තාක්ෂණය සහ ප්‍රකාශන භාවිතාවන් අඛණ්ඩව පරිණාමය වන නිසා,  "සියල්ලටම ගැලපෙන එක්" නියාමන විසඳුමක් නොමැත. කෙසේ වෙතත්, විවිධ පද්ධතිවල උගත් පාඩම් සහ අසාර්ථකත්වයන් නිරීක්ෂණය කළ හැකි අතර එසේ කළ යුතුය. වෙනස් තත්වයන් යටතේ වුවද විවිධ පැතිවලින් පොදු ලක්ෂණ සොයාගත හැකිය. කලින් දන්නා දේම අලුතින් සොයාගැනීමෙන් ප්‍රයෝජනයක් නැත. මෙය සැබවින්ම BBNMAPS හි ප්‍රධාන තීරණ ගන්නන් සහ බෙදා ගැනී සඳහා අදාළ අත්දැකීම් ඇති අය සම්බන්ධ වන මෙම අතථ්‍ය සංවාද මාලාවේ යටි අරමුණකි.


යෝජිත ප්‍රධාන විසඳුම් පහත දැක්වේ. එකක් තෝරාගෙන අනෙක් සියල්ල බැහැර කිරීම අවශ්‍ය නොවේ. උදාහරණයක් ලෙස, "ස්වයං නියාමන" විසඳුමක් නියාමන පරීක්ෂණ අවකාශයක් තුළ ක්‍රියාත්මක කළ හැක (පහත 1 වන කොටුවේ දැක්වෙන පැහැදිලි කිරීම බලන්න). එමගින් වෙනස් විසඳුමක් සඳහා ක්‍රියා කරන අතරම සාර්ථක වන දේ සහ අසාර්ථක වන දේ ගැන ඉගෙන ගැනීමට අවස්ථාව ලැබේ.

- ලිහිල් "ස්වයං නියාමනය": UGC මගින් සිදුවන හානියට එරෙහිව පිළියම් සඳහා පරිශීලකයින්ගෙන් ඇති ඉල්ලුම හමුවේ, වේදිකාවන් විසින් තම අන්තර්ගතයන් සමාලෝචනය කිරීම සඳහා තමන්ගේම ක්‍රම දියුණු කරන ලදි. නිර්ණායක පදනම් වූයේ ප්‍රජා ප්‍රමිතීන් (බොහෝ විට සියලුම රටවලට අදාළ වේ) සහ ජාතික නීති (රටට විශේෂිත වූ) මතය. පිළිගත නොහැකි දේ පිළිබඳ නිර්ණායක පිළිබඳ විස්තර පුළුල් ලෙස ප්‍රසිද්ධකර තිබුණේ නැත. මෙම නිර්ණායක ප්‍රකාශයට පත් කිරීම සහ ඒවා සංවර්ධනය කිරීම සඳහා භාවිතා කරන ලද උපදෙස් විමසීම් ප්‍රමාණය වේදිකාවෙන් වේදිකාවට වෙනස් විය. ඇල්ගොරිතම මගින් ප්‍රමුඛතාව ඉවත් කිරීම සහ පිටුවල/ පුද්ගලයන්ගේ ශ්‍රේණිගත කිරීම පහත දැමීම ප්‍රමිති උල්ලංඝණය වන විට ගන්නා ක්‍රියාමාර්ගවලට ඇතුළත් වේ.
- දැඩි "ස්වයං නියාමනය" ඉහත දක්වන ලද පරිදි සංවර්ධනය කර බලාත්මක කරන ලද ප්‍රමිතීන් මත පදනම් වේ. නමුත් සම්බාධක වඩාත් දරුණු ය: අනතුරු ඇඟවීම්, අන්තර්ගතයන් ඉවත් කිරීම් සහ නිශ්චිත කාල සීමාවන් සඳහා පළ කිරීමට එරෙහි තහනම් නියෝග ඒ අතර වේ.

- සම-නියාමනය සමග අන්තර්ගතයන් සමාලෝචනය කිරීම සිදු කරන ආයතනය හැර වෙනත් පාර්ශවයන් ද සම්බන්ධ වේ. ඒ අනුව, සම නියාමනයේදී වේදිකා සමාගම් විසින් රාජ්‍ය නොවන හෝ කර්මාන්තයන් සඳහා විශේෂිත ආයතන විසින් සංවර්ධනය කරන ලද සහ බලාත්මක කරන ලද භාවිතා සංග්‍රහයන් පිළිපැදිය යුතුය. නොපිළිපැදීම සඳහා වන සම්බාධක, සහභාගී වන වේදිකා සමාගම් විසින් අත්සන් කරනු ලබන රීති සංග්‍රහවල නිශ්චිතව දක්වා ඇත.

- දෘඪ තත්වයන්හිදී, රීති සංග්‍රහ සමාලෝචනය කිරීමට සහ රීති සංග්‍රහ අනුගමනය කරන බව සහතික කිරීමට රජයේ බලධාරීන් සම්බන්ධ වේ. සම්බාධක නීතියෙන් දක්වා තිබේ. සංකල්පමය වශයෙන් වෙනස් වුවද, UGC හි දැඩි සම-නියාමනයේ ප්‍රතිඵල ඍජු රාජ්‍ය නියාමනයේ ප්‍රතිඵලවලින් වෙන්කර හඳුනාගත නොහැක. වෙනස වන්නේ වේදිකා සපයන්නා රාජ්‍යයේ නියෝජිතයෙකු ලෙස ක්‍රියා කරනමුත් සාමාන්‍ය ආරක්ෂාව හෝ රාජ්‍යයේ පරිපාලන ක්‍රියාමාර්ග හා සම්බන්ධ ස්වාභාවික යුක්තිය නිසි ක්‍රියාවලියේ නොමැති වීමයි. ඇත්ත වශයෙන්ම, මෙම නියාමන ස්වරූපය වඩාත් දැඩි විය හැකිය. රාජ්‍ය බලධාරීන්ගේ අදහස් පිළිබඳ අවිනිශ්චිතතාව නිසා සමාජ මාධ්‍ය වේදිකා සමාගම උවමනාවට වඩා වැඩි නියාමනයක නිරත විය හැකිය.[2]

1 රූපය: අන්තර්ගතයන් සමාලෝචනය කිරීමේ විසඳුම් වට්ටෝරුව




**1 මංජුසාව: නියාමන පරීක්ෂා අවකාශ –** *'කෘත්‍රිම බුද්ධිය සහ පරීක්ෂා අවකාශ' හරහා - යුරෝපීය පාර්ලිමේන්තු පර්යේෂණ සේවය (ERPS) විසින් කරනු ලබන දැනුවත් කිරීම*[3]

නියාමක පරීක්ෂා අවකාශයක් යනු යම් කාල සීමාවක් තුළ නියාමකවරයෙකුගේ අධීක්ෂණය යටතේ නව නිෂ්පාදන හෝ සේවා නව්‍යකරණය කිරීමට සහ පරීක්ෂා කිරීමට ආයතනවලට ඉඩ සලසන පර්යේෂණාත්මක අවකාශයකි.

නියාමන පරීක්ෂා අවකාශ මගින් ව්‍යාපාර පිළිබඳ ඉගෙනීමට, සැබෑ ලෝක පරිසරයක් තුළ නවෝත්පාදනයන් සංවර්ධනය කිරීමට සහ පරීක්ෂා කිරීමට, නියාමනයකින් යුතුව ඉගෙනීමට, නියාමන අධිකාරියක අධීක්ෂණය

[2] Canaan, I. (2022). NetzDG and the German Precedent for Authoritarian Creep and Authoritarian Learning. *Columbia Journal of European Law*, p. 101 on.

[3] https://www.europarl.europa.eu/RegData/etudes/BRIE/2022/733544/EPRS_BRI(2022)733544_EN.pdf

යටතේ ඔවුන්ගේ නවෝත්පාදන ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපාරවලට මගපෙන්වීටම හා සහාය දැක්වීමට සහ පර්යේෂණාත්මක නෛතික තන්ත්‍ර සැකසීම සඳහා අවස්ථාව ලබාදෙයි.

නියාමන පරීක්ෂා අවකාශ "නියාමනය අවශ්‍යතාව පරිදි සැකසීම" සඳහා ඉඩ ලබාදෙන අතර නවෝත්පාදකයින්ට සංකීර්ණ නියාමන භූ දර්ශනවල සැරිසැරීමට අවස්ථාව ලබාදෙයි. ඒ අතරම, නියාමකයින්ට නව තාක්ෂණයන් නියාමනය කිරීමට උත්සාහ කිරීමට පෙර ඔවුන්ගේ අවබෝධය ගැඹුරු කිරීමට එමගින් කාලය ලබා දෙයි. ඵලදායී ලෙස සැලසුම් කර ඇත්නම්, පාලිත අවදානම් සහ අධීක්ෂණ රාමුවක් තුළ නවෝත්පාදනය සිදු වේ. නියාමන පරීක්ෂා අවකාශ භාවිතය මූල්‍ය අංශයේ බහුලව දක්නට ලැබෙන අතර, ෆින්ටෙක් හෙවත් බැංකු හා මූල්‍ය සේවාවන්හි නව වර්ධනයන් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියේදී වැඩි වැඩියෙන් භාවිතා කරනු දක්නට ලැබේ. එක්සත් රාජධානිය, නෝර්වේ, ජපානය සහ තවත් රටවල් "ෆින්ටෙක් පරීක්ෂා අවකාශ" භාවිතා කරමින් මෙම ප්‍රවේශය තෝරාගෙන ඇත. මෙය එලෙසම අනෙකුත් ක්ෂේත්‍රයන් වෙතද ව්‍යාප්ත කළ හැකිය. එමගින් නවෝත්පාදනයන් සඳහා නම්‍යශීලී පරිසරයක් සැපයිය හැකිය. එසේම, ඉහළ ගතිකත්වයක් සහිත සහ තාක්‍ෂණික වශයෙන් තීව්‍ර අංශ නියාමනය කිරීම සඳහා යොදාගත හැකිය.

## අන්තර්ගතයන් අනුමැතිය සඳහා නිර්ණායක

ඉහත දක්වා ඇති සෑම විසඳුමකෙදීම අන්තර්ගතයන් සමාලෝචනය කිරීමේ නියැලී සිටින අයට ඔවුන්ගේ ක්‍රියාකාරකම් සඳහා මඟ පෙන්වන යම් නිර්ණායක තිබීම අවශ්‍ය වේ. අන්තර්ගතයන් සම්බන්ධ රීති සංග්‍රහ සඳහා නිර්ණායක පැහැදිලිව ප්‍රසිද්ධ කිරීම වඩා යෝග්‍යය. සමාගමට අදාළ විශේෂිත ස්වයං නියාමනයන් සම්බන්ධයෙන් ද එය මෙසේම විය හැකිය. ඵලදායි සම-නියාමනය සඳහා, අන්තර්ගතයන් සමාලෝචනය කිරීම සිදු කරන වේදිකා පාර්ශ්වයේ සහ එම ක්‍රියාකාරකම නියාමනය කිරීමේ නියැලී සිටින රාජ්‍ය බලධාරීන්ගේ පාර්ශ්වයේ එකඟතාව ප්‍රයෝජනවත් වනු ඇත. පැහැදිලිව සඳහන් කර ඇති නිර්ණායක නොමැතිව ගිවිසුම පැවතිය නොහැක. ඇත්ත වශයෙන්ම, දැනට තිබෙන දැඩි සම-නියාමන පාලන තන්ත්‍රවල එක් ප්‍රධාන අඩුපාඩුවක් නම්, වැඩ පීඩනය යටතේ අන්තර්ගතයන් සමාලෝචනය කිරීමේ යෙදී සිටින අය විසින් නීතිමය වශයෙන් බලය ලත් බලධාරීන් විසින් පළකිරීමෙන් පසුව කුමන නිර්ණායක යොදනු ඇත්දැයි අනුමාන කළ යුතුව තිබීමයි.

අන්තර්ගතයන් සමාලෝචනය කිරීමේදී භාවිතා වන නිර්ණායක, ප්‍රජා ප්‍රමිතීන් ලෙස හඳුන්වනු ලැබේ.[4] ප්‍රජා ප්‍රමිති යනු, "අසභ්‍ය" (නීති විරෝධී) ලෙස තහනම් කළ හැකි අන්තර්ගතයන් හෝ "අශෝභන" (නීති විරෝධී නොවේ) අන්තර්ගතයන් හෝ වෙත ප්‍රවේශය සීමා කළ හැකි බව සඳහන් කරන ලද එක්සත් ජනපද අධිකරණ තීන්දුවලින් උපුටා ගන්නා ලද යෙදුමකි. එම වචන භාවිතය භෞතික සමීපත්වය මගින් නිර්වචනය කරන ලද ප්‍රජාවන් මත පදනම් වේ. නාගරික, ප්‍රාන්ත හෝ ජාතික සීමාවන්ගේ අධිකරණ බලයන් ද ඒවා මත බලපෑ හැකිය. ප්‍රජාවන් භෞතික සමීපත්වය හෝ නීත්‍යානුකූලව පිහිටුවා ඇති පාලන ප්‍රදේශයක් තුළ සිටීම හැර වෙනත් නිර්ණායක මගින් නිර්වචනය කිරීමේ හැකියාව සහිත ඔන්ලයින් අවකාශයන් වෙත මෙම ප්‍රවේශය පරිවර්තනය කිරීමේදී පැහැදිලි ගැටලු ඇති වේ.

ප්‍රධාන වේදිකා සමාගම්වල ප්‍රතිපත්තිවල පුළුල් අර්ථ දැක්වීම් අඩංගු වේ. ඇතුළත් කරන ලද අන්තර්ගතය දේශීය නීති සහ සම්මතයන්ට අනුකූල විය යුතු බව එයින් අඟවනු ලැබේ. කෙසේ වෙතත්, එය එතරම් සරල කාරණයක් නොවේ. උදාහරණයක් ලෙස, Facebook හෝ Instagram හි අන්තර්ගතයන් දේශීය නීතියට පටහැනි යැයි රජයන් විශ්වාස කරන විටදී, ඔවුන් අන්තර්ගතය සීමා කරන ලෙස ඉල්ලා සිටිය හැකිය. නැතහොත් අන්තර්ගතය සීමා කිරීමට අධිකරණ නියෝග තිබිය හැකිය. අන්තර්ගතය නීති විරෝධී බවට චෝදනා රාජ්‍ය නොවන ආයතන සහ මහජනතාව විසින් සිදු කළ හැකිය. Facebook සහ Instagram විසින් ගෝලීය ජාල මූලපිරුමේ (Global Network Initiative) සහ ආයතනික මානව හිමිකම් ප්‍රතිපත්තියේ (Corporate Human Rights Policy) සාමාජිකයින් ලෙස කැපවී තිබෙන ආකාරයට අනුකූලව මෙම ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වනු ඇත.[5]

Facebook, Twitter, TikTok, සහ Reddit වැනි වේදිකාවන් ප්‍රකාශ කරන්නේ යම් රටක බලධාරීන් විසින් ඉහත දක්වන ලද නිර්ණායක සපුරාලන ලෙස ඉල්ලීමක් කළ විට අන්තර්ගතය සීමා කළ හැකි බවයි. අන්තර්ගතය හෝ

[4] https://transparency.fb.com/en-gb/policies/community-standards/

[5] https://transparency.fb.com/data/content-restrictions/content-violating-local-law

කණ්ඩායමක ක්‍රියාකාරිත්වය එක් රටක නීත්‍යානුකූල වන නමුත් වෙනත් රටකදී එසේ නොවන විට මෙය විශේෂයෙන් අදාළ වේ. අන්තර්ගතය සමාලෝචනය කිරීම සඳහා වේදිකා මගින් රටට විශේෂිත නීති සම්පාදනය කළ අවස්ථා පහත දැක්වේ:

● ජර්මනිය රට තුළ තහනම් කරන ලද නව-නාසි කණ්ඩායමකට ප්‍රවේශය ට්විටර් විසින් අවහිර කරන ලදි. එහිදී ඔවුන්ගේ 'රට විසින් සීමාකරන ලද අන්තර්ගතයන්' පිළිබඳ ප්‍රතිපත්තිය පළමු වරට ක්‍රියාත්මක කරන ලදි.

●ඉන්දියාව. 2021 ජූලි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ විශේෂයෙන්ම රටේ පරිශීලකයින් සඳහා පරිශීලකයන් විසින් ජනනය කරන ලද අන්තර්ගත අයිතම 337කට ප්‍රවේශය Facebook විසින් සීමා කරන ලදි. එසේ කරනු ලැබුවේ, තොරතුරු තාක්ෂණ පනතේ 69A වගන්තිය උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය විසින් ලබාදෙන ලද උපදෙස්වලට ප්‍රතිචාර වශයෙනි.

●පකිස්ථානය. NSFW (වැඩ සඳහා ආරක්ෂිත නොවේ) subreddits මගින් සිය පෙරනිමියෙන් (by default) තහනම් කර ඇත.

ප්‍රජා ප්‍රමිතීන් සහ කර්මාන්ත රීති සංග්‍රහ සැකසීම සඳහා පුළුල් පරාසයක පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය සහ සංවාදය අවශ්‍ය වේ. නවසීලන්ත නීති සංග්‍රහය සම්බන්ධයෙන් ගත් කල, "සමස්ත සමාජයේ සහයෝගීතාවය සහ සම්බන්ධීකරණය" නම් මූලධර්මය විසින් පරිපූර්ණ බහු පාර්ශවකාර ප්‍රවේශයක් ඉදිරිපත් කරයි. එය තනිව ක්‍රියා කරන එක් ආයතනයක විකල්පයට වඩා සමතුලිතය. මෙයට විවිධ කණ්ඩායම් ඇතුළත් වේ. එහෙත්, නියෝජනය නොවිය හැකි කණ්ඩායම් දෙකක් සංවාදයේදී පෙන්වා දෙන ලදි. එනම්, සරණාගතයින් වැනි රාජ්‍යයක් නොමැති අය සහ රාජ්‍ය බලධාරීන් කෙරෙහි විශ්වාසය නොතබන කිසියම් රාජ්‍යයකට අයත් පුරවැසියන්.

පැහැදිලි, පුරෝකථනය කළ හැකි සහ සමතුලිත ප්‍රතිපත්ති ප්‍රකාශ සිදුකරන ව්‍යුහයන් ස්ථාපිත කිරීම සඳහා, හැකි තරම් පුළුල් කණ්ඩායමක් සමඟ සාකච්ඡා කිරීම අත්‍යවශ්‍ය යැයි අපේක්ෂා කරනු ලැබේ. ඵලදායී සහයෝගීතාවයක් ඔස්සේ පරිශීලකයින් අන්තර්ජාලයේ සුරක්ෂිතව තබා ගැනීමේ වගකීම මෙම සියලු පාර්ශ්වකරුවන් විසින් බෙදා ගන්නා පරිසරයක් එමගින් නිර්මාණය කරනු ලැබේ. වේදිකාවන් විසින් අන්තර්ගතයන් සමාලෝචනය කිරීම හේතුවෙන් අසමාන ලෙස බලපෑමට ලක්වන ආන්තික පාර්ශවයන් පරිශීලක ප්‍රතිපත්ති සකස් කරන කණ්ඩායම්වලට සම්බන්ධ කරගත යුතු බව සංවාදයට සහභාගී වූවන් විසින් යෝජනා කරන ලදි.

මීට අමතරව, සංවාදයට සහභාගිවූවන් කිහිප දෙනෙක් අන්තර්ගතයන් සමාලෝචනය කිරීම සම්බන්ධ තීරණ ගැනීමට භාවිතා කරන ඇල්ගොරිතම පිළිබඳව කනස්සල්ල පළ කළහ. සමහර භාෂාවල ගැටලුකාරී අන්තර්ගතයන් නිසි ලෙස හඳුනා ගැනීමට හෝ දේශීය සූක්ෂ්මතා හඳුනා ගැනීමට ඇල්ගොරිතමවලට ඇති හැකියාව සහ එවැනි අන්තර්ගතයන් හඳුනා ගැනීමට හෝ නිවැරදි කිරීමට සමාලෝචකයන්ට ඇති හැකියාව පිළිබඳව ඔවුහු සැක පහළ කළහ. කෙසේ වෙතත්, මෙතෙක් නොසලකා හැර ඇති භාෂාවල ක්‍රියාවලි සහ තාක්ෂණය දියුණු කිරීම සඳහා වේදිකා විසින් වැඩි ආයෝජනයක් සිදුකරන බව ද එහිදී ප්‍රකාශ විය.

## ස්වයං නියාමනය

"ස්වයං නියාමනය" ආකාර දෙකකින් සිදුවිය හැක. පළමුවැන්න නම්, සමාජ මාධ්‍ය වේදිකා සපයන්නා තමන්ගේම ප්‍රජා ප්‍රමිතීන් සකසා ඒවා බලාත්මක කිරීමයි. බලාත්මක කිරීමේ ක්‍රියාවන්හි ප්‍රමිතීන් සහ විනිවිදභාවය වෙනස් කිරීම සම්බන්ධයෙන් එහිදී වැඩි නම්‍යශීලී බවක් ඇත. දෙවන ස්වරූපයෙන් සිදුවන්නේ, උපදෙස් විමසා සංවර්ධනය කරන ලද කර්මාන්ත රීති සංග්‍රහයක් පිළිපැදීමට වේදිකා සපයන්නන් සාමූහිකව එකඟ වීමයි. මෙහිදී, වෙනස් කිරීම් සහ විනිවිදභාවය සම්බන්ධයෙන් ඇත්තේ අඩු නම්‍යශීලීභාවයකි.

සමස්ත කර්මාන්තයට අදාළ ස්වයං නියාමන යෝජනා ක්‍රමයක් සමග සසඳන විට වෙන වෙනම වේදිකා මගින් සිදුකරනු ලබන ස්වයං නියාමනය අන්තර්ගතයන් සමාලෝචනය කරන්නන් හට වැඩි නම්‍යශීලී බවක් ලබා දෙයි. පරිශීලකයාගේ දෘෂ්ටිකෝණයෙන් ගත් කල, කර්මාන්ත රීති සංග්‍රහයක් මත පදනම් වූ ස්වයං නියාමනය වැඩි නිශ්චිතභාවයක් ලබා දෙන අතර, ක්‍රියාවලිය කෙරෙහි විශ්වාසය ජනනය කිරීමට වඩාත් හිතකර වේ. විශේෂයෙන්ම රීති සංග්‍රහයට අත්සන් කර ඇති සමාගම් දිගටම එයට අනුගත වන බව සහතික කිරීම සඳහා ස්වාධීන ආයතනයක් වගකිව යුතු වන විට එසේ සිදු වේ.

කර්මාන්ත රීති සංග්‍රහ මගින් නම්‍යශීලීබව නැති කිරීමක් සිදුවන්නේ නැත. ශීඝ්‍රයෙන් පරිණාමය වන වෙළෙඳපොළ සහ තාක්ෂණික තත්ත්වයන් හේතුවෙන් රීති සංග්‍රහ තවදුරටත් වැඩිදියුණු කිරීම අවශ්‍ය බව පෙන්වා දෙන ලදි. මෙය සාකල්‍ය, බහු පාර්ශ්වික ප්‍රවේශයක් භාවිතයෙන් සිදු කර ඇත්නම් සහ අන්තර්ගතයන් සමාලෝචනය කිරීමේ යෙදී සිටින අයට සහ ඔවුන්ගේ ක්‍රියාවන්ගෙන් පීඩාවට පත් වූවන්ට වෙනස්කම් හොඳින් සන්නිවේදනය කර තිබේ නම්, නිශ්චිතභාවයට සහ විශ්වාසයට එමගින් අහිතකර බලපෑමක් ඇතිවන්නේ නැත.

## සම-නියාමනය

අන්තර්ගතයන් සමාලෝචනය කිරීමේ ඕනෑම ප්‍රතිපත්තියක් විවිධ පාර්ශ්වයන්ගෙන් අභියෝගයට ලක්වනු ඇත. හානි ලෙස සලකනු ලබන තත්වයන් සඳහා පිළියම් සොයන අය අන්තර්ගතයන් සමාලෝචනය කිරීමේ ප්‍රතිපත්ති ලිහිල් වැඩි යයි ප්‍රකාශ කරනු ඇත. ප්‍රතිපත්ති හේතුවෙන් සම්බාධකවලට ලක්වන ලද අය ප්‍රමිතීන් ගැන සහ ඒවා ක්‍රියාත්මක කිරීම උවමනාවට වඩා දැඩි වීම ගැන අසතුටට පත් වනු ඇත. නියමිත ක්‍රියාවලියක් සහ අභියාචනා කිරීමේ අවස්ථා නොමැතිකම ගැන ඔවුන් පැමිණිලි කරනු ඇත. රජයේ බලධාරීන්ට ඔවුන්ගේම හේතූන් මත හෝ ඉහත පාර්ශව දෙකෙන් එකක් හෝ දෙකම වෙනුවෙන් අන්තර්ගතයන් සමාලෝචනය කිරීමේ ප්‍රතිපත්ති සහ ඒවා ක්‍රියාත්මක කිරීම ප්‍රශ්න කළ හැකිය.

ඔන්ලයින් අන්තර්ගතයන් සමාලෝචනය කිරීමේ සැහැල්ලුම ආකාරයේ අධීක්ෂණ ක්‍රියාවලියකදී, අන්තර්ගතයන් සමාලෝචනය කිරීමේදී භාවිතා කරන නිර්ණායක සහ ක්‍රියා පටිපාටි ප්‍රසිද්ධියට පත් කරන්නැයි රජය විසින් නියම කළ හැකිය. ප්‍රමිතීන් මත පදනම්ව ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ දත්ත සියල්ල ප්‍රකාශයට පත්කිරීම විනිවිදභාවය සම්බන්ධ අවශ්‍යතා අතරට ඇතුළත් විය හැකිය. මෙම ක්‍රියා රාජ්‍යය විසින් නියම කිරීම අවශ්‍ය නොවන මුත් වේදිකා සමාගම විසින් ස්වේච්ඡාවෙන්ම එය සිදු කළ හැකිය.

ප්‍රජා ප්‍රමිතීන් සකස් කිරීම සහ සංශෝධනය කිරීම පිළිබඳ මහජන අදහස් ලබා ගැනීම සඳහා ප්‍රතිපාදන සමාජ මාධ්‍ය වේදිකා සමාගම් විසින් තනිවම හෝ අදාළ රාජ්‍ය අධිකාරීන්/ ප්‍රඥප්ති මගින් නියම කර ඇති පරිදි සිදු කළ හැකිය. තවත් ස්ථරයක් වනුයේ වේදිකා සමාගම තුළම හෝ පිටතින් අභියාචනා යාන්ත්‍රණයන් සම්පාදනය කිරීමයි.

අන්තර්ගතයන් සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියෙන් පැනනගින තීරණ සම්බන්ධ අභියාචනා විභාග කිරීමට රජය සම්බන්ධ වූ පසු, අන්තර්ගතයන් සමාලෝචනය කිරීම සඳහා භාවිතා කරන ප්‍රමිතීන් සම්බන්ධයෙන් රජයට යම් ආකාරයක අධිකාරී බලයක් අවශ්‍ය විය හැකිය. උපරිම මට්ටමේදී, ප්‍රතිචාර දැක්වීමේ කාලය නිශ්චිතව දක්වන නීති සහ රජයේ බලධාරීන් විසින් සමාලෝචනය කරන ලද මුල් තීරණ මත දඬුවම් නියම කරන නීති සම්පාදනය කළ හැකිය.[6]

විනිවිද නොපෙනෙන ආකාරයට සහ ඇතැම් විට දේශපාලන නිර්ණායක මත පදනම්ව කුමන අන්තර්ගතයට ඉඩ දෙන්නේද යන්න පිළිබඳ තීරණ ගැනීමට රජයේ බලධාරීන්ට පිටුබලයක් ලැබීම මෙහි තිබෙන අවදානමයි. රජය තුළින් හෝ ඉන් පිටතින් මෙය සිදුවනු දැකීමට අකමැති අය විවිධ ආකාරයේ ස්වයං නියාමන අත්දැකීම් මත පදනම්ව වඩා යහපත් ආරක්ෂාවක් සම්පාදනය කිරීමට කැමති විය හැකිය.

මේ අනුව, අවශ්‍ය නම්, වඩාත් විස්තීර්ණ විසඳුම් සම්පාදනය කරන තෙක් මෘදු සම-නියාමනය ආදේශකයක් ලෙස යොදාගත හැකි බවට අදහස් ප්‍රකාශ විය. පුරවැසි විශ්වාසය ගොඩනඟන අතරම, විමර්ශකයින්, නඩු පවරන්නන් සහ අනෙකුත් අනුබද්ධ පාර්ශවයන්ගේ ධාරිතාව වැඩිදියුණු කිරීමට මෙමගින් රාජ්‍යයන්ට අවස්ථාව ලබා දෙයි. ඔන්ලයින් හානි කළමනාකරණය සඳහා දේශපාලනීකරණය නොකරන ලද ස්වාධීන කාර්යයන් ඉටුකිරීම පද්ධතිය කෙරෙහි පුරවැසියන්ගේ විශ්වාසය තහවුරු කිරීමේදී වැදගත් විය හැකිය. ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් හැකියාවක් නොමැති අත්තනෝමතික සහ වැරදි තොරතුරු මත පදනම් වූ නීති ක්‍රියාත්මක කිරීම

---

[6] https://www.loc.gov/item/global-legal-monitor/2021-07-06/germany-network-enforcement-act-amended-to-better-fight-online-hate-speech/#:~:text=Background%20on%20the%20Network%20Enforcement%20Act&text=The%20Network%20Enforcement%20Act%20is,after%20receiving%20a%20user%20complaint.

වෙනුවට මෙය විකල්පයක් විය හැකිය. එවැනි අත්තනෝමතික සහ වැරදි තොරතුරු මත පදනම් වූ නීති හේතුවෙන් කාරණා වඩාත් නරක අතට හැරිය හැකිය.

## අන්තර්ගතයන් සමාලෝචනය කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති සැකසීමේදී පාර්ශවකරුවන්ගේ කාර්යභාරය


ප්‍රජා ප්‍රමිතීන් සහ කර්මාන්ත රීති සංග්‍රහ සැකසීම සඳහා පුළුල් පරාසයක පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය සහ සංවාදයක් අවශ්‍ය වේ. නවසීලන්ත රීති සංග්‍රහය සම්බන්ධයෙන් ගත් කල, එහි තිබෙන "සමස්ත සමාජයේ සහයෝගීතාවය සහ සම්බන්ධීකරණය" නම් මූලධර්මය වඩා සමතුලිත, පරිපූර්ණ බහු පාර්ශවකාර ඉදිරිපත් කරයි. එහිදී එක් ආයතනයක් බේරුම්කරු ලෙස ක්‍රියා කරයි. මෙයට විවිධ කණ්ඩායම් ඇතුළත් වන අතර, බොහෝ දුරට සාකච්ඡාවට සහභාගි කර නොගන්නා ලද කණ්ඩායම් දෙකක් කෙරෙහි සංවාදයේදී අවධානය යොමු විය: පළමු කණ්ඩායම සරණාගතයින් වැනි රටක් නැති අය වන අතර දෙවැනි පිරිස වූයේ තමන්ගේ රාජ්‍ය නියෝජනය කෙරෙහි අතෘප්තිමත් කිසියම් රාජ්‍යයකට අයත් පුරවැසියන්ය.


පැහැදිලි, පුරෝකථනය කළ හැකි සහ සමතුලිත ප්‍රතිපත්ති ඉදිරිපත් කරන ව්‍යුහයන් ස්ථාපිත කිරීම සඳහා, හැකි තරම් පුළුල් කණ්ඩායමක් සමඟ සාකච්ඡා කිරීම අත්‍යවශ්‍ය යැයි සලකන ලදි. ඵලදායී සහයෝගීතාවයකින් පරිශීලකයින් අන්තර්ජාලයේ ආරක්ෂිතව තබා ගැනීමේ වගකීම මෙම සියලු පාර්ශවකරුවන් විසින් බෙදා ගන්නා පරිසරයක් එමගින් නිර්මාණය කරනු ලැබේ.

## නිර්දේශ

- කර්මාන්ත රීති සංග්‍රහ සම්පාදනය කරන විට පමණක් නොව, වෙනස් වූ තාක්‍ෂණයට සහ වෙනත් කොන්දේසිවලට ප්‍රතිචාරාත්මක ලෙස ඒවා කාලානුරූපව සංශෝධනය කරන විට ද පාර්ශ්වකරුවන්ගේ එකතු කිරීම් ලබාගැනීම සඳහා ඇති අවස්ථා පුළුල් කිරීමට සලකා බැලීම.
- "නියාමන පරීක්ෂණ අවකාශ" ලෙස භාවිතා කළ හැකි කර්මාන්ත ස්වයං නියාමන රීති සංග්‍රහ සලකා බැලීම. හානිකර අන්තර්ගතයන් බෙදා හැරීමට සහ පුරවැසියන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට අන්තර්ගතයන් සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියෙන් සිදුවන බලපෑම් පිළිබඳව ඉගෙන ගැනීමට එවැනි ප්‍රවේශයක් මඟින් රජයට සහ පාර්ශවකරුවන්ට ඉඩ සැලසේ. අවශ්‍ය යැයි සැලකේ නම්, දැනුම මත පදනම් වූ නීති සම්පාදනය කිරීමට මෙමගින් අවස්ථාව ලැබේ. උදාහරණයක් ලෙස, වේදිකා සමාගම්වල කර්මාන්ත රීති සංග්‍රහවල අන්තර්ගතයන් සමාලෝචනය කිරීමේ භාවිතාවන් පිළිබඳ අතෘප්තිමත් අන්තර්ගත නිර්මාපකයින්/ බෙදාහරින්නන් සඳහා පිළියම් ලබාදීම සඳහා එවැනි රීති සංග්‍රහයක් තුළට ප්‍රතිපාදන ඇතුළත් කිරීම සලකා බැලිය හැකිය.
- ඊට සමාන්තරව, අදාළ රටවල නීති විරෝධී අන්තර්ගතයට එරෙහිව ක්‍රියාමාර්ග ගන්නා අය තුළ නීති විරෝධී අන්තර්ගතයන් සහ අනවශ්‍ය නමුත් නීති විරෝධී නොවන අන්තර්ගතයන් අතර වෙනස හඳුනා ගැනීම සඳහා ධාරිතාව වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.
- ආණ්ඩු සහ වේදිකා අතර සම්බන්ධය සංවාදාත්මක ස්වරූපයෙන් පවත්වා ගන්න. විශේෂිත අධිකරණ බල ප්‍රදේශවල අන්තර්ගතයන් සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් විවෘත ප්‍රතිපෝෂණය සහ පාර්ශ්වයන් අතර සහයෝගී ප්‍රවේශයක් අනුගමනය කිරීම දෙපාර්ශවය අතර විශ්වාසය තහවුරු කිරීමට උපකාරී වේ. දේශීය අවශ්‍යතා, සිරිත් විරිත් සහ සම්ප්‍රදායන් සැලකිල්ලට ගැනීම අවශ්‍ය විටදී මෙය විශේෂයෙන් ප්‍රයෝජනවත් විය හැකිය.

# 1 ඇමුණුම: VD3 සහභාගීත්ව විශ්ලේෂණය



# 2 ඇමුණුම: සහභාගී වූවන්ගේ ලැයිස්තුව

| සංවාද මණ්ඩප සාමාජිකයා | | |
|---|---|---|
| Brent Carey | Netsafe | නවසීලන්තය |
| Meg Chang | Meta | සිංගප්පූරුව |
| Gehan Gunatilleke | LexAG | ශ්‍රී ලංකාව |
| Dr. Md Ershadul Karim | මලයා විශ්වවිද්‍යාලය - University of Malaya | බංග්ලාදේශය |
| Sofyan Sultan | Soch Fact Check | පකිස්තානය |
| **සහභාගී වන්නා** | | |
| Sadiul Islam Antor | බංග්ලාදේශයේ නීති ආධාර සේවා භාරය - Legal Aid and Services Trust (BLAST) | බංග්ලාදේශය |
| Babu Ram Aryal | අන්තර්ජාල රාජ්‍යපාලන ආයතනය - Internet Governance Institute | නේපාලය |
| Atifa Asghar | Prime Institute | පකිස්තානය |
| Miraj Ahmed Chowdhury | Digitally Right Limited | බංග්ලාදේශය |
| Sheikh Manjur E Alam | Transparency International බංග්ලාදේශය | බංග්ලාදේශය |
| Arosha Fernando | ජනාධිපති මාධ්‍ය ඒකකය - ප්‍රති දූස්තොරතුරු ඒකකය | ශ්‍රී ලංකාව |
| Yasser Latif Hamdani | Irfan and Irfan Law firm | පකිස්තානය |
| Faheem Hussain | සමාජයේ අනාගත නවෝත්පාදනයන් සඳහා පාසල, ඇරිසෝනා විශ්වවිද්‍යාලය - School for the Future of Innovation in Society, Arizona State University | බංග්ලාදේශය |
| Hija Kamran | ප්‍රගතිශීලී සන්නිවේදනය සඳහා සංගමය - Association for Progressive Communications (APC) | පකිස්තානය |
| Usama Khilji | Bolo Bhi | පකිස්තානය |
| Mr. Khalid Latif | මානව හිමිකම් අමාත්‍යාංශය - Ministry of Human Rights | පකිස්තානය |
| Aisha Moriani | තොරතුරු තාක්ෂණ සහ විදුලි සංදේශ අමාත්‍යාංශය - Ministry of IT and Telecommunications | පකිස්තානය |
| Prihesh Ratnayake | Hashtag Generation | ශ්‍රී ලංකාව |
| Detepriya Roy | BRAC | බංග්ලාදේශය |
| Muhammad Saad | Prime Institute | පකිස්තානය |
| Quadaruddin Shishir | AFP Factcheck, බංග්ලාදේශය | බංග්ලාදේශය |
| Prabesh Subedi | ඩිජිටල් මාධ්‍ය පදනම - Digital Media Foundation | නේපාලය |
| Mr. Babur Suhail | තොරතුරු තාක්ෂණ සහ විදුලි සංදේශ අමාත්‍යාංශය - Ministry of IT and Telecommunications | පකිස්තානය |
| Saimum Reza Talukdar | සාමාජික, කෘත්‍රිම බුද්ධිය සම්බන්ධ වැඩ කණ්ඩායම - Artificial Intelligence Working Group, HAC | බංග්ලාදේශය |